I - 126
Library Copy.
20.2.2014

# කොළඹ ජාතික කෞතුකාගාරයේ පවතින ථෙරවාදී බෞද්ධ සම්ප්‍රදාය නියෝජනය කරන පුස්කොළ අත් පිටපත් පිළිබඳ විශ්ලේෂණාත්මක අධ්‍යයනයක්

**ටී. එච්. නිලන්ත ඉන්දික**

ලි. ප. අංකය 0707

කැලණිය විශ්වවිද්‍යාලයේ පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනයෙහි දර්ශනපති උපාධි පරීක්ෂණයේ අවශ්‍යතා සම්පූර්ණ කිරීම් වස් ඉදිරිපත් කෙරෙන පර්යේෂණ නිබන්ධයකි.

අධීක්ෂකවරු:

මහාචාර්ය පියදාස රණසිංහ

ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය දේශප්‍රිය ගුණසේන

වර්ෂය : 2013

# සාර සංග්‍රහය

මෙම පර්යේෂණය කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ පවත්නා සූත්‍ර පිටකාබද්ධ ග්‍රන්ථ එකතුව අළලා කරන ලද්දකි. මේවා විශ්ලේෂණය කිරීමේ දී ලංකාවේ සෑම පළාතක් මෙන් ම ප්‍රදේශයක් ම නියෝජනය කරන ග්‍රන්ථ එකතුවක් බව කිව හැකි ය. තව ද භාෂාව හා ග්‍රන්ථාගත තොරතුරු අනුව 17 සිට 21 වන සියවස්වල පිටපත් කළ ග්‍රන්ථ බව පැහැදිලි වේ.

ලංකාව පුරා පවත්නා ත්‍රිපිටකාබද්ධ ග්‍රන්ථ නිරීක්ෂණය කිරීමේ දී විනය සහ අභිධර්ම පිටපත්වලට වඩා සූත්‍ර පිටක ග්‍රන්ථ සාහිත්‍යය බහුල වශයෙන් දක්නට ලැබේ. ඒ අනුව සූත්‍ර පිටක ධර්මය සෙසු ධර්ම කොට්ඨාසවලට වඩා සාමාන්‍ය ජනතාව අතර ජනප්‍රිය වූ ධර්ම සාහිත්‍යය බවට පත්ව ඇතැයි ප්‍රකාශ කළ හැකි ය.

තව ද මෙරට පුස්කොළ පොත් අධ්‍යයනය කරන පාඨක ප්‍රජාව දිනෙන් දින ඉහළ යන බව පෙනේ. මේවා ජාතික හා ජාත්‍යන්තර තලයේ ප්‍රචලිත කිරීමට නම් සුදුසු ග්‍රන්ථ නාමාවලි සකස් කළ යුතුව ඇත. ඒවාට විසඳුම් සොයා ගැනීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන පරමාර්ථ සහ අරමුණු ලෙස සැලකිය හැකි ය. ඒ අනුව මෙම පර්යේෂණය සඳහා උපකාරී කරගන්නා වූ සූත්‍ර පිටක ග්‍රන්ථ එකතුව අභ්‍යන්තර හා බාහිර වශයෙන් විශ්ලේෂණය කොට ලබාගත්තා වූ දත්ත පරිච්ඡේද පහක් ඔස්සේ දිගහැරේ.

අධ්‍යයනයේ පසුබිම සහ ශ්‍රී ලංකාවේ පුස්කොළ පොත් සාහිත්‍යය වංශයේ ආරම්භය හා ඓතිහාසික විකාශනය ප්‍රථමයෙන් සාකච්ඡා කරයි. පුස්කොළ අත්පිටපත් සාහිත්‍යය විවිධ හේතු නිසා යම් යම් පසුබෑසීම්වලට ලක් වුව ද එය ලේඛන සම්ප්‍රදායක් මෙන් ම ලේඛන සාහිත්‍යයක් ලෙස අවිනශ්ටව වර්තමානය දක්වා ඉදිරි ගමනක යෙදුණු ආකාරය මුල් පරිච්ඡේදය තුළ සලකා බැලේ. තව ද ථේරවාදී ත්‍රිපිටකාබද්ධ ධර්ම සාහිත්‍යයේ ඓතිහාසික විකාශනය පිළිබඳ නූතනය දක්වා වූ දත්ත විශ්ලේෂණයක් දෙවන පරිච්ඡේදයේ සහ තෙවන පරිච්ඡේදයේ දී කොළඹ කෞතුකාගාර පුස්තකාලයේ පවත්නා සූත්‍ර පිටක ග්‍රන්ථ එකතුව පිළිබඳ ව ද විමසා බැලේ.

සිව්වන පරිච්ඡේදයේ දී කෞතුකාගාර පුස්තකාලයේ තැන්පත් කර ඇති අත් පිටපත් එකතුව පිළිබඳ කරුණු සාකච්ඡා කරන අතර මෙම අධ්‍යයනය සඳහා පසුබිම් කරගත් සමස්ත සූත්‍ර පිටකාගත ග්‍රන්ථ එකතුව අළලා පූර්ණ ග්‍රන්ථ විද්‍යාත්මක තොරතුරු ඇතුළත් ග්‍රන්ථ නාමාවලිය පස්වන පරිච්ඡේදයෙන් ඉදිරිපත් කෙරේ.

හයවන පරිච්ඡේදයේ දී අධ්‍යයනය ආරම්භයේ සිට අවසානය දක්වා රැස්කළ දත්ත පිළිබඳ විශ්ලේෂණය කරමින් පර්යේෂණයේ ඵලය හෙවත් නිගමනය පැහැදිලි කර නිමාවට පත් කෙරේ.



පුස්කොළ පොත්; ත්‍රිපිටකය; සූත්‍ර පිටක ග්‍රන්ථ නාමාවලිය; කොළඹ කෞතුකාගාර පුස්තකාලය